5.2 පොත් හා සඟරා - ලකුණු 2.5 × 2

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරණ පොත් හා සඟරා සඳහා පමණක් ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ)

* උපරිම පර්යේෂණ හා / හෝ ග්‍රන්ථ දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

5.3 අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබා දෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ එකකට ලකුණු 01 බැගින් උපරිම 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

**6. සේවා ඇගයීම** **උපරිම ලකුණු 05**

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 01 බැගින් උපරිම සේවා ඇගයීම් 05ක් සඳහා

සටහන : දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වේ.

**7. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු 10**

ඔබගේ ආයතනයේ, ඔබ විසින් රාජකාරි ඉටු කිරීමේදී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ **කරුණක් / අවස්ථාවක්** පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

I. ප්‍රවේශය හා හැදින්වීම - ලකුණු 2
II. අන්තර්ගතය - ලකුණු 2
III. කාල කළමනාකරණය - ලකුණු 2
IV. ඉදිරිපත් කිරීමේ විලාශය - ලකුණු 2
V. නිමාව හා නිගමනය - ලකුණු 2

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

**8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබූ සමස්ථ කුසලතාව** **උපරිම ලකුණු 05**

| 100 |
|---|



Scanned with MOBILE SCANNER